# පාලි මිලින්දපඤ්හයේ විවාද කාණ්ඩය සහ සංවාද කාණ්ඩය අන්තර්ගතය පිළිබඳ නව විවරණයක්

යටදොළ වත්තේ ධම්මවිසුද්ධි හිමි

පාලි මිලින්ද පඤ්හයේ විවිධ අංශ අළලා කරන ලද විචාර බොහෝ වෙයි. මිලිඳු රජු සහ නාගසේන ස්ථවිරයන් වහන්සේ අතර ඇති වූ ප්‍රශ්නෝත්තර ඇතුළත් සල්ලාපය හුදු ප්‍රබන්ධයක් ද? නැතහොත් සත්‍ය සිද්ධියක් ද? එම සල්ලාපය සිදු වූ වකවානුව කුමක් ද? සල්ලාපය සංග්‍රහකොට රචිත ග්‍රන්ථය කවර වකවානුවක ලියන ලද ද? එම ග්‍රන්ථය ඒක කර්තෘකද නැතහොත් බහු කර්තෘකද? මුල් ග්‍රන්ථය කවර භාෂාවකින් ලියන ලද ද? එයට පසුව එකතු කළ කොටස් තිබේද? ඒවා මොනවාද? ආදී විවිධ විචාර නූතන උගතුන්ගේ විමර්ශනවලට ලක් වී ඇත.

මෙම උත්සාහයේ ප්‍රධාන අරමුණ එකී ප්‍රශ්න සියල්ල නිරාකරණය කිරීම නොව **මිලින්දපඤ්හයේ** ප්‍රධාන බෙදීම් දෙකක් ගැන පාඨකයන්ගේ අවධානය යොමු කිරීමයි. මෙහිලා චීන, ජපන්, ප්‍රංශ ජර්මන් ආදී විවිධ භාෂාවලින් ලියැවුණු විචාර ග්‍රන්ථ කියවීමට පහසුකම් නැතිවීම අඩු පාඩුවක් ලෙස පෙනී යයි. එහෙත් මෙම අධ්‍යාපනය අප දන්නා තරමින් මෙතෙක් කර නැති වර්ගීකරණයක් මත පදනම් වී ඇති හෙයින් විවිධ භාෂාවලින් ලිඛිත විචාර ග්‍රන්ථ කියවීම නොලැබීම එතරම් අඩු පාඩුවක් ලෙස සැලකිය නොහැක.

**මිලින්දපඤ්හය** සම්පාදනය කළ කතුවරයා හෝ කතුවරුන් මුළු ග්‍රන්ථයම ප්‍රධාන කොටස් හයකට වර්ග කර ඇත. එනම් පුබ්බයෝග, මිලින්ද පඤ්හ; ලක්ඛණ පඤ්හ, මෙණ්ඩක පඤ්හ, අනුමාන පඤ්හ සහ ඕපම්ම පඤ්හ නමිනි. ඒ අතර මිලින්ද පඤ්හ නම් කොටස ලක්ඛණ පඤ්හ සහ විමතිච්ඡේදන පඤ්හ නමින් අනුකොටස් දෙකකට ද, මෙණ්ඩක පඤ්හ නම් කොටස මහාවග්ග සහ යෝගී කථා නමින් කොටස් දෙකකට ද